768

# අර්ථකථන සම්ප්‍රදය කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් පාලි සාම්ප්‍රදයික තර්ක ක්‍රමය පිළිබඳ අධ්‍යයනයක්

FACULTY OF GRADUATE STUDIES
RECEIVED
07 AUG 2012
UNIVERSITY OF KELANIYA

කැලණිය විශ්වවිද්‍යාලයේ මානව ශාස්ත්‍ර පීඨයේ පාලි හා බෞද්ධ අධ්‍යයන අංශයේ දර්ශනපති උපාධිය සඳහා පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය වෙත ඉදිරිපත් කරන ස්වාධීන නිබන්ධය

දිනය :- 2011 - ජුනි - 26

නම :- විජිතපුර ගුණරතන හිමි

ශිෂ්‍ය අංකය :- **FGS / 04 / 02 /06 / 2007 / 02**

කැලණිය විශ්වවිද්‍යාලය

කැලණිය

ප්‍රවේශ අංකය: 768
වර්ග අංකය:

## සාර සංග්‍රහය

අට්ඨකථා සම්ප්‍රදාය කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් පාලි සාම්ප්‍රදායික තර්ක ක්‍රමය පිළිබඳ අධ්‍යයනයක් යන මාතෘකාව යටතේ රචනා වන නිබන්ධිකාව පරිච්ඡේද පහක් යටතේ සාකච්ඡා කෙරේ. විශේෂයෙන් පාලි සම්ප්‍රදාය තුළ එයට ම අනන්‍ය වූ තාර්කික ස්වභාවය හඳුනා ගැනීම මෙහි අපේක්ෂිත පරමාර්ථය වේ. ද්විකෝටික හා ත්‍රිකෝටික තර්ක ක්‍රමවල පවත්නා ඌනතා පෙන්වා දීමත් බෞද්ධ තර්ක ක්‍රමයෙහි සුවිශේෂත්වය හඳුනා ගැනීමත් මෙහි දී බලාපොරොත්තු වේ.

පළමු පරිච්ඡේදයේ දී සාකච්ඡාවට භාජනය වන මාතෘකා කිහිපයක් ඇත. එහි දී පෙරදිග තර්ක ක්‍රමයේ හමුවන ඥානවිභාගාත්මක හා ලක්ෂණ හඳුනා ගැනේ. තෙවැදෑරුම් භාරතීය දාර්ශනික සම්ප්‍රදායයන් හඳුනා ගනිමින් ඒ සම්බන්ධව පවත්නා විවිධ අදහස් මෙම පරිච්ඡේදයේ දී විශේෂ සාකච්ඡාවට භාජනය කෙරේ. සම්ප්‍රදායවාදී, බුද්ධිවාදී හා අනුභූතිවාදීන් ලෙසින් හඳුන්වන මොවුහු සැබෑ ලෙස ම කවුරුන් ද යන්න හඳුනාගැනීම පෙරදිග තර්ක ක්‍රමය අධ්‍යයනය කිරීමේ දී අත්‍යවශ්‍ය වේ. අනතුරුව තර්කයේ සප්ත පදාර්ථ මගින් විශ්වය විශ්ලේෂණය කිරීම සිදු වේ. එහි දී ලෝකය ද්‍රව්‍ය ගුණ කර්ම සාමාන්‍ය විශේෂ සමවාය අභාව වශයෙන් මූල ධර්ම හතකට බෙදෙන ආකාරය සාකච්ඡා කෙරේ. තර්ක සංග්‍රහය යටතේ අන්නම්භට්ටාචාර්යන් විසින් මෙය විශ්ලේෂණය කළ ආකාරය පිළිබඳ වැඩි අවධානය යොමු කරනු ලැබේ. දර්ශනය තර්කය හා න්‍යාය ශාස්ත්‍රය අතර සම්බන්ධතාවයක් දැකිය හැකි ය. ග්‍රීක දර්ශනයේ සිට ෂට් ශාස්තෘ දර්ශනය දක්වා ක්‍රමිකව විකාශනය වූ අයුරු සාකච්ඡාවට භාජනය කිරීම අත්‍යවශ්‍ය වේ. එසේ ම තර්කය පිළිබඳ පෙරදිග හා අපරදිග ආකල්පය සොයා බලමින් න්‍යාය ශාස්ත්‍රයේ සුවිශේෂත්වය පිළිබඳ මෙහි දී අවධානයට ලක් වේ. අවසානයේ දී ප්‍රත්‍යක්ෂය හා අනුමානය පිළිබඳ සාකච්ඡා කෙරේ. මුල් බුදුසමයේ සිට ධර්මකීර්ති පාදයන් දක්වා කාලය තුළ ප්‍රත්‍යක්ෂය හා අනුමානය පිළිබඳ සිදු කළ සාකච්ඡා මෙහි දී සාකච්ඡාවට භාජනය කරනු කැමැත්තෙමි.

දෙවන පරිච්ඡේදය භාෂාව පිළිබඳ විග්‍රහය යටතේ සාකච්ඡා කෙරේ. තර්ක ශාස්ත්‍රය භාෂාව පිළිබඳ දක්වන්නේ සුවිශේෂී අවධානයකි. එයට හේතුව වන්නේ භාෂාවෙන් තොරව තර්කයක පැවැත්මක් නො මැති හෙයිනි. ප්‍රථමයෙන් භාෂාව හා භාෂාවේ ස්වරූපය පිළිබඳ අධ්‍යයනය කිරීම අත්‍යවශ්‍ය වේ. විවිධ විද්වතුන් ඒ පිළිබඳ දක්වා ඇති නිර්වචන කෙරෙහි මෙහි දී අවධානය යොමු වේ. භාෂාව හා අර්ථය පිළිබඳ බුදුසමයට ම අනන්‍ය වූ ආකල්පයක් ඇත. එය මෙහි දී සාකච්ඡා කෙරේ. ව්‍යවහාරික භාෂාව ප්‍රවේශමෙන් භාවිත කළ යුතු බව බුදුසමයේ අදහසයි. ඇතැම් සංකල්ප ඉදිරිපත් කිරීමේ දී

භාෂාව ප්‍රමාණවත් වේ ද යන්න ගැටළුවකි. බුදුන් වහන්සේගේ සිත තුළ පහළ වූ ප්‍රථම සන්දේහය ද මෙයයි. තමන් අවබෝධ කළ ධර්මය අන්‍යයන්ට පහසුවෙන් තේරුම් ගත නො හැකි බව උනවහන්සේට කල්පනා විය. යමක් තථාගතයන්ගෙන් ඇසූ කළ එයට පිළිතුරු දෙන ක්‍රම කිහිපයක් ඇත. ඒ අතරින් ඨපනීය ප්‍රශ්න සුවිශේෂී ය. දශ අව්‍යාකෘත ප්‍රශ්න සාකච්ඡාවට භාජනය වන්නේ මෙම ප්‍රස්තුතය යටතේ ය. භාෂාව හා තර්කය අතර පවත්නා අන්තර් සම්බන්ධතාවය පිළිබඳ සොයා බැලීම ද අත්‍යවශ්‍ය වේ. විවිධ භාෂා වර්ග හඳුනා ගනිමින් තර්ක ශාස්ත්‍රයේ දී එය භාවිත කරන අයුරු මෙහි දී සාකච්ඡා කෙරේ. තර්කය පිළිබඳ විවිධ වූ ආකල්ප දැකිය හැකි ය. අපරදිග හා පෙරදිග ආකල්පය ඒ අතරින් සුවිශේෂී ය. එපමණක් ද නො ව තර්කය පිළිබඳ මුල් බුදුසමයට අනන්‍ය වූ ආකල්පයක් පවත්නා බව ද අමතක කළ නො හැකි ය. බුදුසමය තර්කයේ ප්‍රයෝජනය හඳුනා ගන්නා අතර තර්කය ප්‍රතික්ෂේප කරනු ද දැකිය හැකි ය. මෙම පරිච්ඡේදයේ දී ඒ පිළිබඳ අවධානය යොමු වේ. අනතුරුව සත්‍ය පිළිබඳ බෞද්ධ ආකල්පය විමසා බැලේ. මෙහි දී විශේෂයෙන් ම සූත්‍ර පිටකය කෙරෙහි අවදානය යොමු කරමින් සත්‍ය පිළිබඳ බෞද්ධ ආකල්පය විමසා බැලේ.

තෙවන පරිච්ඡේදය තර්ක ගොඩනැගීමෙහි ලා බලපෑ තර්ක විෂය ක්ෂේත්‍රය නම් වේ. බුදුන් වහන්සේ සරල ලෙස දේශනා කළ ධර්මය පසුකාලීනව විවිධ අභිමතාර්ථ යටතේ සුවිශේෂී සාකච්ඡාවට භාජනය කරනු දැකිය හැකි ය. එම මාතෘකා අතර ආත්ම සංකල්පය, කර්මය, පුනර්භවය, චිත්ත හා චෛතසික විග්‍රහයන් සුවිශේෂී වේ. පසුකාලීන අභිධර්ම යුගයේ දී චිත්ත චෛතසික විභාගය විශේෂ සාකච්ඡාවට භාජනය වනු දැකිය හැකි ය. එනිසා ඒ පිළිබඳ මෙහි දී සාකච්ඡා කිරීම වඩාත් සුදුසු ය.

හතර වන පරිච්ඡේදය තර්ක ක්‍රමයකට අනුබල දෙන නිකායාගත සාධක නමින් දැක් වේ. මෙහි දී බුදුන් වහන්සේගේ දේශනාවන්හි ස්වභාවය හා තර්කානුකූල බව පිළිබඳ සාකච්ඡා කෙරේ. චතුෂ්කෝටික තර්ක ක්‍රමය පිළිබඳ අධ්‍යයනය මෙහි දී ඉතා වැදගත් වේ. චතුෂ්කෝටික න්‍යාය විවිධ අයුරින් සාකච්ඡා කොට තිබෙනු දැකිය හැකි ය. පෙළෙහි හමුවන චතුෂ්කෝටිගත අවස්ථා, කාල අවකාශ සංකල්පය, නාගාර්ජුන පාදයන්ගේ චතුෂ්කෝටික තර්ක ක්‍රමය මෙහි දී සුවිශේෂීව සාකච්ඡා කෙරේ. බුදුන් වහන්සේ බෞද්ධ සංකල්ප ඉදිරිපත් කිරීමේ දී විවිධ තාර්කික විධි අනුගමනය කළහ. ඒ පිළිබඳ මෙහි දී සාකච්ඡා කෙරේ. මේ සම්බන්ධව සාකච්ඡා කිරීමේ දී කථාවත්ථුප්පකරණයෙහි වාද ස්වරූපය පිළිබඳ අවධානය යොමු කිරීම වඩාත් සුදුසු ය. එපමණක් ද නො ව කථාවත්ථුවේ අපෝහක තර්ක වාද සම්ප්‍රදාය පිළිබඳවත් මෙහි දී සාකච්ඡා කෙරේ.

පස්වන පරිච්ඡේදය හෙවත් අවසාන පරිච්ඡේදය පශ්චාත් පේටක ප්‍රාග් අට්ඨකථා ග්‍රන්ථයන්හි භාවිත තාර්කික අවස්ථා හා ඒවායෙහි සුවිශේෂතා නමින් හැඳින්වේ. මෙම යුගය තුළ රචිත ප්‍රධාන ග්‍රන්ථ තුනක් දැකිය හැකි ය. එනම් මිළින්ද පඤ්හ, නෙත්තිප්පකරණ හා පේටකෝපදෙසයයි. මෙම ග්‍රන්ථ තුන ම සුවිශේෂී වන්නේ ඒවාට ම අනන්‍ය වූ තාර්කික විධීන්ගෙන් යුක්ත හෙයිනි. බුද්ධඝෝෂ හිමියන් පවා පාලි අට්ඨකථා රචනයේ දී මේවායෙහි ආභාෂය ලබා ඇත. මෙම ග්‍රන්ථ තුනෙහි පවත්නා සුවිශේෂත්වය සලකා මෙම පරිච්ඡේදයේ දී මේ සම්බන්ධව සාකච්ඡා කිරීමට අදහස් කෙරේ.